# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/42— 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මෙ නියෝග හදිසි අවස්ථා (වාරිමාර්ග කර්මාන්ත ආරක්ෂා කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. වාරිමාර්ග ආඥාපනතෙහි හෝ වෙන යම් නීතියක කුමක් සඳහන් වුව ද මේ නියෝග බලාත්මක වන්නේ ය.

3. (අ) වාරිමාර්ග කර්මාන්තයක් පිහිටා ඇත්තේ යම් ප්‍රදේශයක් තුළ ද ඒ ප්‍රදේශය විෂයෙහි අධිකාරය දරන ඉංජිනේරු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු හෝ ඒ ප්‍රදේශයේ කෘෂිකාර්මික පලද වර්ධන කමිටුව විසින් පත් කරන ලද අනුයෝජිතයකු හෝ නොවන කිසිම තැනැත්තකු විසින් එම වාරිමාර්ග කර්මාන්තය මෙහෙයවීම, අයුතු ලෙස පරිහරණය කිරීම, එම වාරිමාර්ග කර්මාන්තයට අවහිර කිරීම හෝ එය සම්බන්ධයෙන් කිසිම ආකාරයක යමක් කිරීම හෝ ඒ වාරිමාර්ග කර්මාන්තයෙන් ජලය හැරවීම නොකළ යුතු ය.

(ආ) කිසිම තැනැත්තකු විසින්, යම් වගා කන්නයක් වෙනුවෙන් ජලය පාවිච්චි කිරීමට වාරිමාර්ග ආඥාපනතේ විධිවිධාන යටතේ ඔහුට හිමිකම් ඇත් නම් මිස, ඒ කන්නය තුළ දී යම් වාරිමාර්ග කර්මාන්තයකින් කිසිම ආකාරයකින් ජලය පාවිච්චි කිරීම නොකළ යුතුය. යම් විශේෂ වගා කන්නයක දී වාරිමාර්ග කර්මාන්තයකින් ජලය පාවිච්චි කිරීමට යම් තැනැත්තකුට හිමිකම තිබෙද නැද්ද යන්න පිළිබඳව, එම වාරිමාර්ග කර්මාන්තය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් තුළ ද ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාගෙන් වූ සහතිකයක් ඒ කරුණ පිළිබඳ තීරණාත්මක සාක්ෂිය වන්නේ ය.

(ඇ) යම් වාරිමාර්ග කර්මාන්තයකට අදාළව ඉංජිනේරුවකු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධරයකු හෝ කෘෂිකාර්මික පලද වර්ධන කමිටුවක් හෝ ඒ කමිටුව විසින් බලය දෙනු ලැබූ අනුයෝජිතයකු හෝ විසින් කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු අයුතු ලෙස මැදිහත් නොවිය යුතුය.

4. 3 වන නියෝගයෙහි විධිවිධාන කිසිවක් කඩ කරන හෝ කඩ කර ඇති යම් තැනැත්තෙක් වරෙන්තුවක් නොමැතිව යම් පොලිස් නිලධරයකු විසින් සිරභාරයට ගනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. තවද මහේස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතු හේතු නිසා පැමිණිල්ල නිස්සාර යයි හෝ හිංසාකාරී යයි හෝ සුළු යයි ඔහු අදහස් කරතහොත් මිස, මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයේ තැබිය යුතු ය.

5. (1) යම් තැනැත්තකු 4 වන නියෝගය යටතේ රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ අවස්ථාවක, ඒ රිමාන්ඩ් භාරයේ තැබීම පිළිබඳව සහ එම සිද්ධියට අදාළ කරුණු, මහේස්ත්‍රාත්වරයා විසින් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැන්විය යුතු ය.

(2) යම් තැනැත්තෙක් එසේ රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ විට, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් සිය අභිමතය පරිදි බන්ධනාගාර කොමසාරිස් වෙත අමතනු ලබන ලියවිල්ලකින් වූ නියමයකින්, ඒ නියමයෙහි ලේකම් විසින් දක්වනු ලබන යම් නියම හා කොන්දේසි වෙතොත් ඒ නියම හා කොන්දේසිවලට යටත්ව ඒ තැනැත්තා මුදා හරින ලෙස විධාන කරන්නේ නම් මිස, ඒ තැනැත්තා බන්ධනාගාර කොමසාරිස් භාරයෙහි තැබිය යුතුය.


99 A—ඒ 24065—2,100 (76/12)